# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**ඒකක පරීක්ෂණය**

**11 ශ්‍රේණිය** | **පුරවැසි අධ්‍යාපනය** | ඒකකය 5 - ජාත්‍යන්තර සම්බන්ධතා

- **අංක 01 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

01. පහත රටවල් අතුරින් සාර්ක් සංවිධානයට අයත් රටක් නොවන්නේ කුමන රටද?

(1). ශ්‍රී ලංකාව

(2). මාලදිවයින

(3). චීනය

(4). නේපාලය

02. සාර්ක් සංවිධානයට මෑතක දී එක් වූ දකුණු ආසියාතික රට වන්නේ කුමක්ද?

(1). බංගලාදේශය

(2). නේපාලය

(3). පකිස්ථානය

(4). ඇෆ්ගනිස්ථානය

03. ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වා ගැනීමේ ක්‍රමවේද අතුරින් රාජ්‍ය උපාය සම්බන්ධතා ක්‍රමවේදයක් ලෙස සැලකිය හැක්කේ,

(1). තානාපතිවරුන්, මහ කොමසාරිස්වරුන්, රාජ්‍ය දූතයන් ආදී නිල මට්ටමේ නිලධාරීන් මගින් රටවල් අතර සම්බන්ධතා ඇතිකර ගැනීම.

(2). තම නිෂ්පාදන වෙනත් රටවල් සමග හුවමාරු කර ගැනීම.

(3). කලාපීය වශයෙන් රටවල් ඒකරාශී වී විවිධ සංවිධාන පිහිටුවා ගැනීම.

(4). යුධමය වශයෙන් අවශ්‍ය විශේෂඥ පුහුණුව රටවලට ලබාදීම.

04. පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල තානාපතිවරුන් හඳුන්වන්නේ,

(1). විදෙස් දූතයන් නමිනි

(2). මහකොමසාරිස් නමිනි

(3). කොන්සල්වරු නමිනි

(4). ජාත්‍යන්තර සම්බන්ධීකාරකවරු නමිනි

05. තනාපතිවරයකු හෝ රාජ්‍ය දූතයකු තුළ තිබිය යුතු ගුණාංගයක් වන්නේ,

(1). තම රටේ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම

(2). තමා නියෝජනය කරන රට පිළිබඳව යහපත් ප්‍රතිරූපයක් ඇති කිරීම

(3). රාජ්‍යයන් අතර මිත්‍රත්වය ගොඩනැගීම

(4). තම රට පිළිබඳව හා තමා සේවය කරන රට පිළිබඳව මනා අවබෝධයක් තිබීම

06. ප්‍රථම කලාපීය යුධමය සංවිධානය වන්නේ,

(1). ආසියාන් සංවිධානය

(2). නේටෝ සංවිධානය

(3). සාර්ක් සංවිධානය

(4). බිම්ස්ටෙක් සංවිධානය

07. දෙවන ලෝක යුද්ධය අවසාන වීමත් සමග නැවත එවැනි ලෝක යුද්ධයක් ඇතිවීම වළක්වා ගැනීම සඳහා පිහිටුවා ගත් සංවිධානය වන්නේ,

(1). නේටෝ සංවිධානය

(2). එක්සත් ජාතීන්ගේ සංවිධානය

(3). සාර්ක් සංවිධානය

(4). ලෝක සෞඛ්‍ය සංවිධානය

08. විදේශ වෙළඳාම හා සම්බන්ධ නොවන ජාත්‍යන්තර සංවිධානය වන්නේ කුමක්ද?

(1). යුරෝපා පොදු වෙළඳ හවුල

(2). ගැට් සංවිධානය

(3). ජාත්‍යන්තර මූල්‍ය අරමුදල

(4). සාර්ක් සංවිධානය

09. ළමා අයිතිවාසිකම් තහවුරු කිරීම හා ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් ගොඩ නගාගත් සංවිධානය වන්නේ,

(1). එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල

(2). එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල

(3). එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය

10. තානාපතිවරුන්ගේ හා රාජ්‍ය දූතයන්ගේ කාර්යභාරයක් නොවන්නේ,

(1). තම රටේ ප්‍රතිපත්ති අවබෝධ කර දීම.

(2). තම රට නියෝජනය කරමින් තමාට අභිමත පරිදි ක්‍රියා කිරීම.

(3). තම රටේ පුරවැසියන්ගේ අභිලාෂය ආරක්ෂා කිරීම.

- **ප්‍රශ්න අංක 11 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.**

01. ජාත්‍යන්තර සම්බන්ධතා පැවැත්වීම මගින් ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු දෙකක් ලියන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

02. ජාත්‍යන්තර සම්බන්ධතා වර්ධනය වී ඇති විවිධ ක්ෂේත්‍ර අතුරින් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

03. බලවත් රාජ්‍යයන් විසින් බලයෙන් අඩු රාජ්‍ය වෙත බලපෑම් එල්ල කරනු ලබන ක්ෂේත්‍ර දෙකක් දක්වන්න.

.............................................................................................................................................

04. යුධමය අරමුණු මත ගොඩනගා ගත් කලාපීය සංවිධාන දෙකක් නම් කරන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

05. සාර්ක් සංවිධානයේ අරමුණු දෙකක් ලියා දක්වන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

06. ''කොළඹ ක්‍රමය'' යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

07. ''ජාත්‍යන්තර වෙළඳාම'' කෙටියේ පැහැදිලි කරන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

08. ''ද්වි පාර්ශවික වෙළඳාම'' යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

09. ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වනු ලබන මාධ්‍ය දෙකක් දක්වන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

10. තානාපතිවරුන් හා රාජ්‍ය දූතයන් තුළ තිබිය යුතු ගුණාංග දෙකක් ලියා දක්වන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

- **පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

01. (1). ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වනු ලබන ප්‍රධාන ස්වරූප දෙක නම් කරන්න.

(2). ජාත්‍යන්තර සම්බන්ධතා වර්ධනය වීම කෙරෙහි බලපෑ සාධක හතරක් ලියන්න.

(3). ජාත්‍යන්තර ප්‍රජාව විසින් ශ්‍රී ලංකාව කෙරෙහි එල්ල කරන ලද බලපෑම් දෙකක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

02. (1). සාර්ක් සංවිධානයට අයත් රටවල් නම් කරන්න.

(2). සාර්ක් සංවිධානයේ අරමුණු හතරක් ලියන්න.

(3). ආසියාන් සංවිධානය කෙටියෙන් පැහැදිලි කරන්න.

03. (1). විදේශ ආධාර සපයන රටවල් තුනක් නම් කරන්න.

(2). විදේශ ආධාර සපයන සංවිධාන තුනක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(3). ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනගා ගැනීමෙන් අත්වන ප්‍රතිඵල තුනක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

සැකසුම:-අයි.ඩබ්.ඒ. අයෝමි මිය